Sri Lanka Journal of Co-operative studies, Volume 03, Issue 01, 2024
ISSN- 2579-1745, pp. 30–60.

විවිධ සේවා සමුපකාර සමිති අකාර්යක්ෂමතාවයට තීරණ ගැනීමේ ක්‍රියාවලිය දක්වනු ලබන දායකත්වය පිළිබඳ අධ්‍යනය.

(ඌව පලාත් විවිධ සේවා සමුපකාර සමිති ආශ්‍රයෙන්)

වානක දිනේෂ්[1]
දිනූෂ දිසානායක[2]

[1] සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (ඌව පළාත),
[2]wmcdinesh@gmail.com
[2] සහකාර පර්යේෂක, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, පොල්ගොල්ල,
[2]dinusha.d.dissanayake026@gmail.com

සංක්ෂිප්තය

විවිධ සේවා සමුපකාර සමිති අකාර්යක්ෂමතාවයට තීරණ ගැනිමේ ක්‍රියාවලිය දක්වනු ලබන දායකත්වය පිළිබඳ අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. උප අරමුණු ලෙස, විවිධ සේවා සමුපකාර සමිතිවල තීරණ ගැනිමේ ක්‍රියාවලිය අධ්‍යනය කිරීම, විවිධ සේවා සමුපකාර සමිතිවල තීරණ ගැනිමේ ක්‍රියාවලිය අකාර්යක්ෂම වීමට හේතු හදුනා ගැනීම, තීරණ ගැනිමේ ක්‍රියාවලියේ දූර්වලතැන් හඳුනාගෙන පිලියම් වශයෙන් යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීම හඳුනාගන්නා ලදි. මෙහිදී, උද්ගාමී ප්‍රවේශය යටතේ ගුණාත්මක ශිල්ප ක්‍රමය යොදාගනිමින් සිද්ධි අධ්‍යයනයක් සිදුකර ඇත. රාජ්‍ය සහනාධාර බෙදාහැරීම සඳහා සමිති දිගින් දිගටම බැංකු අයිරා මත කටයුතු කිරීම, විගණන වාර්තා නිවැරදිව පරිශීලනය නොකිරීම, විගණන ඌණතා නිවැරදි කිරීමට සමිති කටයුතු නොකිරීම, තොරතුරු සන්නිවේදනය දූර්වල තතත්වයක පැවතීම, උපාය මාර්ගික සැලසුම් තිරසාර නොවීම වැනි හේතු විවිධ සේවා සමුපකාර සමිති අකාර්යක්ෂමතාවය බලපෑම් කරනු ලබන බව හෙළිදරව් විය. රාජ්‍ය සහනාධාර බෙදාහැරීම සමිතියේ සාමාන්‍ය ව්‍යපාරික කටයුතු වලට බාධා නොවන පරිදි සිදුකිරීමට, තීරණ ගැනීමේ දී භාවිතාකල යුතු ලේඛණ හා වාර්තා පරිශීලනය ඉහළ නැංවීම, විගණන ඌණතා නිවැරදි කිරීමට සමුපකාර සමිති සහ සමුපකාර දෙපාර්තමේන්තුව විසින් යාන්ත්‍රණයක් සැකසීම, උපාය මාර්ගික සැලසුම් සමිතියේ දිගුකාලින අවශ්‍යතා සඳහා සැකසීම වැනි දෑ අධ්‍යනය අවසානයේ නිර්දේශ ලෙස ලබාදෙන ලදි.

මූල පද: *අකාර්යක්ෂමතාවය, තීරණ ගැනීම, විවිධ සේවා සමුපකාර සමිති.*

1. හැදින්වීම

වර්තමාන ගෝලීය සමාජය තුළ මිනිසාට තම අවශ්‍යතාවයන් ඉෂ්ට කර ගැනීමට සිදුව ඇත්තේ සංවිධානගත ආයතනික ජාලයක් විසින් සාමුහිකව සිදුකරනු ලබන නිපදවීම, බෙදාහැරීම, හුවමාරුව, පරිභෝජනය යන ක්‍රියාවලියකට දායක වෙමින්ය. ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය අධ්‍යයනය කිරීමේ දී තීරණ ගැනීමේ ක්‍රියාවලියේ සාර්ථක අසාර්ථක බව පිළිබඳ ගැටළු පවතී. (බුලත්ගම, 2011). තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂම බව හෝ අකාර්යක්ෂම බව මත සමස්ත සංවිධානයේ කටයුතු රඳා පවතින බවත්, ඒ තුලින් ආයතනයේ කටයුතු සාර්ථක වීම හෝ අසාර්ථක වීම සිදුවන බවත් හඳුනා ගත හැකියි. (තකාමුරා, 2001). වසර පනහක් ඉක්මවා ලූ ශ්‍රී ලංකාවේ නූතන විවිධ සේවා සමුපකාර ව්‍යාපාර පද්ධතිය සාර්ථක වීම හෝ අකාර්යක්ෂම වීම කෙරෙහි තීරණ ගැනීමේ ක්‍රියාවලිය සෘජු ව බලපා ඇත. විවිධ සේවා සමුපකාර වල පැවැත්මට විවිධ වකවානු වල පත්වූ රජයෙන් තම රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රණයක් ලෙස සමුපකාර ව්‍යාපාරයේ යොදා ගැනීම නිසා සමුපකාර කළමනාකාරිත්වය සමුපකාර ව්‍යවසායේ උන්නතියට තීරණ ගැනීම වෙනුවට රාජ්‍ය ප්‍රතිපත්ති ඉටු කිරීමට තීරණ ගැනීම සිදු කර ඇත. මේ නිසා සමුපකාර සමිතියට ගෝලීය තරගකාරිත්වයට මුහුණ දිය හැකි ව්‍යාපාර පද්ධතියක් නිර්මාණය කරනු වෙනුවට රාජ්‍ය යන්ත්‍රණයේ කොටස් කරුවෙකු බවට පත්වීමට සිදුව තිබුණි. මේ හේතුව නිසා සමුපකාර සමිතිවල ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් හා ව්‍යුහාත්මක වෙනස්කම් ඇති වීමට රාජ්‍ය ප්‍රතිපත්ති සෘජුව බලපා ඇත. (හේරත්, 2000).

විශේෂයෙන්ම 1970 දශකයේ ආරම්භයේ සිට වර්තමානය දක්වා ගෝලීය ආර්ථික, සමාජීය හා සංස්කෘතික පරිසරය සිඝ්‍රයෙන් වෙනස් වී ඇති අතර, ශ්‍රී ලංකාවේ ආර්ථිකය ද සමාජවාදී සුභසාධන රාජ්‍යයේ සිට ධනවාදී ලිබරල් ආර්ථිකයක් දක්වා වෙනස් විය. (ඩැනිසන්, 2012).

මෙම වෙනස් වීමෙන් සෘජු ව බලපෑමට ලක්වූ ශ්‍රී ලාංකික සමාජය ද ආර්ථිකය, සමාජීය හා සංස්කෘතික පරිසරය සිඝ්‍රයෙන් වෙනස් වීමට ලක් විය. මෙසේ සමාජයේ සිඝ්‍ර පරිවර්තනයට ලක්වුව ද ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය විශේෂයෙන්ම විවිධ සේවා සමුපකාර ව්‍යාපාරය, මෙම පරිවර්තනයට හැඩ ගැසීම මන්දගාමීව සිදුවූ අතර මේ සඳහා සමුපකාර ව්‍යාපාරයට සම්බන්ධිත සියලු පාර්ශවයන්ගේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සෘජු ව හේතු විය. (ලාලනි, 2011).

1970 දී සමුපකාර ප්‍රතිසංවිධානයේ සිට විවිධ යුගයන් හි සමුපකාර ව්‍යාපාරයට සිදු වූ බලපෑම හමුවේ සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය, මහ සභාව සහ සමුපකාර දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ තීරණ කොතෙක් දුරට විද්‍යානුකූලව හා ස්වාධිනව ගෙන ඇද්ද එම තීරණ තුලින් සමුපකාර සමිතියට සිදුවූ බලපෑම සම්බන්ධයෙන් පසු විපරම් සිදුකර සමාලෝචනයක් සිදුකර ඇද්ද යන්න හා අකාර්යක්ෂම තීරණ නිවැරදි කර ගැනීමට ගනු ලැබූ ක්‍රමවේදයන් අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි. ඒ සඳහා ක්‍රියාකාරිත්වයෙන් යුත් විවිධ සේවා සමුපකාර සමිති දෙකක් සහ ඈවරකරණයට ලක්කර ඇති විවිධ සේවා සමුපකාර සමිතියක් පාදක කරගෙන මෙම අධ්‍යයනය සිදු කෙරේ. මෙම අධ්‍යයනය සිදුකිරීම තුලින් විවිධ සේවා සමුපකාර සමිති අකාර්යක්ෂමතාවයට තීරණ ගැනිමේ ක්‍රියාවලිය දක්වනු ලබන දායකත්වය හඳුනාගැනීම තුලින් තීරණ ගැනිමේ ක්‍රියාවලියේ දුර්වලතැන් හඳුනාගෙන දුර්වලතා සඳහා පිලියම් වශයෙන් යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කෙරේ. මෙමඟින්, විවිධ සේවා සමුපකාර සමිතිවල අකාර්යක්ෂමතාවය දුරලා කාර්යක්ෂම ව්‍යාපාරික ඒකකයක් ලෙස විවෘත ආර්ථිකයට උචිත අයුරින් වෙලදපොලට ප්‍රවේශ වීමට මඟපෙන්වීම සිදුකිරීමටත් එමඟින් සාර්ථක සමුපකාර සමිති ජාලයක් නිර්මාණය කිරීමට හැකිවීමෙන් තිරසාර සමුපකාර ව්‍යවසායන් මෙරට තුල ගොඩනැඟිය හැකිය.

පර්යේෂණ අරමුණු

ප්‍රධාන පර්යේෂණ අරමුණ

විවිධ සේවා සමුපකාර සමිති අකාර්යක්ෂමතාවයට තීරණ ගැනීමේ ක්‍රියාවලිය දක්වනු ලබන දායකත්වය පිළිබඳ අධ්‍යනය කිරීම.

උප අරමුණු

1. විවිධ සේවා සමුපකාර සමිතිවල තීරණ ගැනිමේ ක්‍රියාවලිය අධ්‍යනය කිරීම.
2. විවිධ සේවා සමුපකාර සමිතිවල තීරණ ගැනිමේ ක්‍රියාවලිය අකාර්යක්ෂම වීමට හේතු හඳුනා ගැනීම.
3. තීරණ ගැනිමේ ක්‍රියාවලියේ දුර්වලතැන් හඳුනාගෙන පිලියම් වශයෙන් යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

අධ්‍යයනයේ වැදගත්කම

මෙම අධ්‍යයනය සිදුකිරීම තුලින් විවිධ සේවා සමුපකාර සමිතිවල තීරණ ගැනිමේ ක්‍රියාවලියේ දුර්වලතැන් හඳුනාගෙන ඒ සඳහා පිලියම් වශයෙන් යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීම සිදුකෙරේ. මෙමඟින් විවිධ සේවා සමුපකාර සමිතිවල අකාර්යක්ෂමතාවය දුරලා කාර්යක්ෂම ව්‍යාපාරික ඒකකයක් ලෙස විවෘත ආර්ථිකයට උචිත අයුරින් වෙළඳපොලට ප්‍රවේශ වීමට මඟපෙන්වීමට අපේක්ෂා කරයි.

2. සාහිත්‍යය විමර්ෂණය

නූතන සමුපකාර ව්‍යාපාරයේ ඉතිහාසය කාර්මික විප්ලවය මත පාදක වන බවට විවාදයක් නැත. 19 වන සියවසයේ දී එංගලන්තය හා ප්‍රංශය මූලික කොට ගෙන පැන නැගුනු කාර්මික විප්ලවය සමුපකාර සංකල්පය ලොව පුරා ප්‍රචලිත වීමට හේතුවිය. පළමු සමුපකාරික ආයතනය ලෙස හමුවන්නේ ස්කොට්ලන්තයේ නැගෙනහිර අර්විෂයාර් හි පෙන්වික් (Fenwick) රෙදි වියන්නන්ගේ සමිතියයි.

ඒ 1761 වර්ෂයේදීය. මෙම සමිතිය දේශීය කම්කරුවන්ට සහන මිලට ඕට් ධාන්‍ය පිටි (Oatmeal) අළෙවිකරනු ලැබිණි. (බුලත්ගම, 2011). වැඩ වසම් සමාජ ක්‍රමය බිඳ වැටී ධනවාදී සමාජ ක්‍රමය බිහිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මතු වූ නව සමාජ පන්ති සම්බන්ධතාවය තුල ප්‍රාග්ධනය හිමි පන්තියක් හා වැටුප් ක්‍රමය හිමි පන්තියක් වශයෙන් පැහැදිලි පන්ති විෂමතා ඇතිවීම හේතු කොටගෙන ශ්‍රමය හිමි පන්තිය ගෙන ගිය අරගලයේ ප්‍රතිඵලයක් වශයෙන් සමුපකාරය සංවිධානාත්මක ස්වරූපයෙන් මතු වූ බව සමුපකාර ඉතිහාසයෙන් ගම්‍ය වේ. (මාතරආරච්චි, 1997).

රොච්ඩේල් පුරෝගාමීන් 1844 අගෝස්තු 15 වන දින සාධාරණත්වයේ පුරෝගාමීන්ගේ සංවිධානය නමින් ඇඳුම් නිෂ්පාදනය කරන කම්කරුවන් විසිඅට දෙනෙකු එක් වී මෙම සංවිධානය ආරම්භ කර ඇත. මෙයින් පෙනෙන්නේ සමුපකාර ව්‍යාපාරයේ පදනම නිෂ්පාදන සාධකයක් වශයෙන් ශ්‍රමය පමණක් හිමි අය එක් වී සිදුකරන ක්‍රියාවක් බවය. (අබේසිංහ, 2011). මෙය ශ්‍රී ලංකාවේ පස්සර වතු කම්කරුවන්ගෙන් මතුවන ලාංකික සමුපකාර ව්‍යාපාරය තුලින් ද ගම්‍ය වේ. කම්කරුවන් මෙසේ එක්වෙද්දී ජර්මනිය වැනි රටවල ගොවින්ගේ එක්වීමෙන් සමුපකාර බිහිවීමෙන් පෙන්නුම් කරන්නේ 1906 ලංකාවේ ගොවීන් එක් වී බිහි වූ සමුපකාර පිලිබඳ කථාව වේ. ප්‍රංශය තුල මතු වූයේ ශ්‍රමිකයන්ගේ සමුපකාර වශයෙන්ය. එය ලංකාවේ කම්කරු සමුපකාර වශයෙන් මතු වූ අතර 1977 න් පසු මැන්පවර් සමාගම වූයේ එකී සමුපකාර ක්‍රමය වේ.

ඩෙන්මාර්කය තුල කෘෂිකාර්මික සමුපකාර බිහි වූ අතර 1940 න් පසු ලංකාවේ එය ගොවි ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ හා බෙදාහැරීමේ සමුපකාර වශයෙන් මතු විය. ඒ අනුව, පන්තිමය සාධකයක් වශයෙන් කම්කරුවන් ද ගොවීන්ද එක් වී සමුපකාරය බිහි කිරිමෙන් සමුපකාරයේ නෛසර්ගික ගුණය මතුකර පෙන්වා ඇත. එමඟින් විවෘත හා ස්වේච්ඡා සාමාජිකයන්ගේ එකතුව කුමන පන්ති පදනමෙන් සිදුවිය යුතු ද යන්න තීරණය කළ හැකි පසුබිමක් නිර්මාණය වී ඇත.

සමුපකාරය සඳහා වු නිර්වචනයන්

1995 දී ජාත්‍යන්තර සමුපකාර සංධානය මැන්චෙස්ටර් සම්මේලනයේ දී සම්මත කරගත් සමුපකාරය පිලිබඳ නිල නිර්වචනය සමුපකාරය යන්න පිළිබඳව විශ්වීය නිර්වචනය වේ. එය 1995 දී "සමුපකාර අනන්‍යතා ප්‍රකාශනය" නැමති ලියවිල්ල ඔස්සේ ප්‍රකාශයට පත්කරන ලදි. එහි වූ පරිදි, "*සමුපකාරය යනු සාමූහික අයිතියක් ඇතිව ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ඇති ව්‍යවසායකයක් මඟින් තම පොදු ආර්ථික සමාජීය හා සංස්කෘතික අවශ්‍යතා සහ බලාපොරොත්තු අභිලාශයන් ඉෂ්ඨ කර ගැනීම සඳහා ස්වේච්චාවෙන් එක්වූ ස්වාධීන පුද්ගල සංවිධානයකි".*

"A co-operative is an autonomous association of persons united voluntarily to meet their common economic, social, and cultural needs and aspirations through a jointly-owned and democratically-controlled enterprise".

කළමනාකරණය හැදින්වීම

විවිධ සේවා සමුපකාර සමිති වල තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා සමිතියේ පාලක මණ්ඩලය වන සභාපති ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී ප්‍රමුඛ විධායක මට්ටමේ, මෙහෙයුම් මට්ටමේ, සියලු නිලධාරීන්, සේවකයන් මෙන්ම සමිතියේ සාමාජිකයන්ද සමුපකාර සංවර්ධන කොමසාරිස් ප්‍රමුඛ සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඍජු ව මැදිහත් වේ. තීරණ ගැනීම හුදෙක් පුද්ගල බද්ධ හෝ තනි පුද්ගල ක්‍රියාවලියක් නොවේ. තීරණ ගැනීම සාමූහික ප්‍රයත්නයක අවසන් ප්‍රතිඵලයයි. තීරණ ගැනීම කළමනාකාරිත්වයේ වැදගත් අංගයයි. (අබේපාල, 2011). එබැවින් විවිධ සේවා සමුපකාර සමිතිවල තීරණ ගන්නා විට කළමනාකරණ සංකල්ප අනුගමනය කිරීම අතිශය වැදගත්ය. ව්‍යාපාර කළමනාකරණයේ දී ඉටු කල යුතු ප්‍රධාන ශ්‍රිතයන් පහක් නූතන කළමනාකරණයේ දී පිළිගෙන ඇත.

කළමනාකරණ විශේෂඥයෙකු වූ ප්‍රංශ ජාතික හෙන්රි ෆැයෝල් (Henry Fayol) විසින් 1916 දී ඉදිරිපත් කරන ලද පරිපාලන න්‍යාය (Administrative Theory) තුලින් ප්‍රධාන කළමනාකරණ ශ්‍රිත 05 ක් හඳුනා ගෙන ඇත. එනම්,

01. සැලසුම්කරණය (Planning)

02. සංවිධාන කරණය (Organizing)

03.අණකිරීම (Commanding)

04. සම්බන්ධිකරණය. (Co-ordinating)

05. පාලනය කිරීම. (Controlling)

හෙන්රි ෆැයෝල් (Henri Fayol) විසින් සඳහන් කරන අන්දමට සංවිධානයක කාර්යය කුමක් වුවත් ඉහත කාර්යයන් සැම කළමනාකරුවෙකුගේම රැකියාවට අදාල වන බවයි. (කලුආරච්චි, 2004). **සැලසුම්කරණය** මූලිකවම කළමණාකරණ කාර්යය වන අතර එමඟින් සංවිධානයට අදාළ අනාගත ක්‍රියාකාරකම් ගොඩනගනු ලැබේ. සංවිධානයක සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීම සඳහා සම්පත් සංවිධානය කිරීම අවශ්‍ය වේ. එය **සංවිධානකරණයයි.** ශ්‍රම විභජනය, අධිකාරිය පැවරීම, නියෝග ගලා යෑම දෙපාර්තමේන්තුකරණය, යනාදී කටයුතු සංවිධානකරණයෙහි වැදගත් කොටස් වේ.

අණකිරීම යනු සංවිධානයෙහි කටයුතු ඉටුකරවා ගැනීම සඳහා යටත් අය වෙත නියෝග හෙවත් විධාන දීමට ඇති හැකියාවයි. **සම්බන්ධිකරණය** හෙවත් සමායෝජනය යනු සංවිධානයේ පුද්ගලයන් කණ්ඩායම් සහ කටයුතු අතර සම්බන්ධතාවයක් පවත්වා ගැනීමයි. කළමණාකරුවන් විසින් බලාපොරොත්තු වන සංවිධාන ප්‍රතිඵලය සහ සත්‍ය ප්‍රතිඵල සැසඳීමත් අවශ්‍ය මාර්ගයෙහි සංවිධානය ගමන් කරවීම පිණිස **පාලන කාර්යය** අවශ්‍ය වේ. එමෙන්ම, කළමනාකරුවෙකු වුවද අපේක්ෂිත සංවිධාන අරමුණු ලඟාකර ගැනීම සඳහා ක්‍රමාණුකූලව කාර්යයන්හි නිරතවීම වැදගත් වේ. (නිශාන්ත, 2019).

කළමනාකරුවන් විසින් සැලසුම්කරණය, සංවිධානකරණය, නායකත්වය හා පාලනය කිරීම යන අන්තර් සම්බන්ධිත කාර්යයන් ඇතුලත් කළමනාකරණ ක්‍රියාවලිය තුල නිරත විය යුතුය.

සී/ස බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතිය

සමුපකාර සමිති බිහි විය යුත්තේ ප්‍රජාව තුලින් ප්‍රජාවගේ අවශ්‍යතා ඉටුකිරීමට වුවද බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතිය 1971 දී ස්ථාපිත කරනු ලැබුවේ එතෙක් පැවති විවිධ සේවා සමුපකාර සමිති 13 ක් ඒකාබද්ධ කරමිනි. සී/ස බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතිය ඌව පළාතේ අනෙකුත් සමුපකාර සමිති හා සසඳා බලන කල ප්‍රශස්ථ මට්ටමෙන් පවත්වාගෙන යනු දක්නට ලැබේ. විශේෂයෙන්ම නූතනයේ දැඩි ආර්ථික තරගයක් සමඟ සමුපකාර ව්‍යාපාරය බිඳවැටීමට ලක් වී තිබෙන යුගයක සී/ස බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතිය වෙළඳපොල ස්ථාවරත්වයක් ලබාගෙන තිබෙන බව නිරීක්ෂණය වේ.

සී/ස වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිය

වැලිමඩ ප්‍රදේශයේ ක්‍රියාත්මක වු සමිති 08 ක් 1971 අංක 408 /42 දරණ 1971 ජුනි 03 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව, සී/ස වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතියට පවරා ඇත. සී/ස වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිය අනෙකුත් සමුපකාර සමිති හා සසදා බලන කල ප්‍රශස්ථ මට්ටමෙන් පවත්වාගෙන යනු දක්නට ලැබේ. විශේෂයෙන්ම නූතනයේ දැඩි ආර්ථික තරගයක් සමඟ සී/ස වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිය යම්කිසි වෙළඳපොල ස්ථාවරත්වයක් ලබාගෙන තිබේ.

ලියාපදංචිය අවලංගු කල ඇවර කරමින් සිටින සී/ස දෙහිවින්න පළාත විවිධ සේවා සමුපකාර සමිතිය

ඇටම්පිටිය ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ සමිති 03 ක් 1971 අංක 408 /42 දරණ 1971 ජුනි 03 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව සී/ස දෙහිවිණි පළාත විවිධ සේවා සමුපකාර සමිතියට පවරන ලදි. කළමනාකරණ අකාර්යක්ෂමතා සහ තීරණ ගැනීමේ දුර්වලතා මත මේ වන විට මෙම සමිතිය ලියාපදිංචිය අවලංගු කර ඇවර කරමින් සිටි.

3. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණ නිබන්ධනය උද්ගාමී ප්‍රවේශය යටතේ ගුණාත්මක ශිල්ප ක්‍රමය යොදාගනිමින් සිදුකර ඇත. මෙහිදී, විවිධ සේවා සමුපකාර සමිතියක අකාර්යක්ෂමතාවය තීරණ ගැනිමේ ක්‍රියාවලිය විශ්ලේෂණය කිරීම සඳහා සිද්ධි අධ්‍යයනය කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙන ලදි. සමුපකාර සමිතියක තීරණ ගැනීමේ ක්‍රියාවලියට අදාළව, ගැඹුරින් සියුම්ව විමර්ශණය කර තොරතුරු රැස්කිරීම, විශ්ලේෂණය කර නිගමනය කිරීම මෙමඟින් සිදු කෙරේ. මෙම පර්යේෂණ නිබන්ධනයේ දී සිද්ධි අධ්‍යයනය පහත පරිදි සිදුකෙරේ.



මූලාශ්‍රය: පර්යේෂක විසින් සකසන ලදි, 2023

අධ්‍යයනයට ලක් කිරීමට අපේක්ෂිත සිද්ධිය තෝරාගැනිම පළමුව සිදුවේ. (සේනාධීර සහ වනසිංහ, 2021). ඒ සඳහා නියැඳිය ලෙස තෝරාගත් සමුපකාර සමිති තුනේ 1970 සිට මේ දක්වා සිදුකර ඇති විගණන වාර්තා මඟින් සමුපකාර සමිතියේ තීරණ ගැනීමට අදාළ සිද්ධීන් අධ්‍යයනය කෙරේ.

සංගණනය

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රිකයේ ලියාපදිංචි කර ඇති විවිධ සේවා සමුපකාර සමිති ප්‍රමාණය 11 කි. විවිධ සේවා සමුපකාර සමිතියක අකාර්යක්ෂමතාවය තීරණ ගැනිමේ ක්‍රියාවලිය විශ්ලේෂණය කිරීම සඳහා ඌව පලාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කර ඇති විවිධ සේවා සමුපකාර සමිති 11 අතරින් සී/ස බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතිය, සී/ස වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිය, සී/ස දෙහිවිණිපළාත විවිධ සේවා සමුපකාර සමිතිය (ලියාපදිංචිය අවලංගු කල) සිද්ධීන් ලෙස තෝරාගන්නා ලදි. ඒ අනුව මෙම අධ්‍යනයේ සමස්ත සංගණනය ලෙස සී/ස බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතිය, සී/ස වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිය සහ සී/ස දෙහිවිණිපළාත විවිධ සේවා සමුපකාර සමිතිය යන සමිති තුනට අදාළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්, මහ සභා නියෝජිතයන්, ප්‍රාදේශික කාරක සභා නියෝජිතයින්, එම සමිතිවල සේවකයින් හා සමුපකාර සමිතිවල සාමාජිකයින්ගෙන් සලකන ලදි.

නියැදිය හා දත්ත රැස්කිරිම

පහසු නියැදිකරණ ක්‍රමය යටතේ ඉහතින් තෝරාගත් සමිති තුනට අදාළව අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්, මහ සභා නියෝජිතයන්, ප්‍රාදේශික කාරක සභා නියෝජිතයින්, සමිතිවල සේවකයින් හා සමුපකාර සමිතිවල සාමාජිකයින්ගෙන් සමන්විත 184 දෙනෙකුගේ නියැදියක් තෝරාගන්නා ලදි.
ප්‍රාථමික දත්ත සංවෘත ප්‍රශ්ණාවලියක් මඟින් එකතු කර ගන්නා ලද අතර ද්විතික දත්ත ඌව පළාත් සමුපකාර දෙපාර්තමේන්තුවේ විගණන වාර්තා, සමුපකාර සමිතිවල එෆ් 28 වාර්තා, අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා, මහ සභා වාර්තා සමුපකාර සමිතිවල මාසික සහ වාර්ෂික වාර්තා, සංවර්ධන සැලසුම් ආදී ලේඛණ මගින් ලබාගන්නා ලදි.

දත්ත විශ්ලේෂණය

රැස් කර ගන්නා ලද දත්ත ඒ ඒ සිද්ධිය අනුව වෙන් කරගෙන එක් එක් සිද්ධියට අදාලව විශ්ලේෂණය කරන ලද අතර දත්ත විශ්ලේෂණය ගුණාත්මක ප්‍රවේශය අනුව සිදුකර ඇත. සංවෘත ප්‍රශ්ණාවලියක් මඟින් එකතු කර ගන්නා ලද දත්ත සරල ගණිතමය ක්‍රමයන් මඟින් විස්තරාත්මකව විස්තර කර ඇති අතර ද්විතික දත්ත අන්තර්ගත විශ්ලේෂණයෙන් විස්තර කරන ලදි.

4. දත්ත විශ්ලේෂණය

සාමාන්‍ය තොරතුරු විශ්ලේෂණය

මෙම පර්යේෂණය සඳහා කාණ්ඩ තුනක් යටතේ ප්‍රශ්ණාවලිය ඉදිරිපත් කරන ලදි. පළමු කාණ්ඩය ලෙස විවිධ සේවා සමුපකාර සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්, මහසභා නියෝජිතයන් සහ ප්‍රාදේශික කාරක සභා නියෝජිතයින් වෙත ප්‍රශ්නාවලි 56 ක් බෙදා දෙන ලදී. නියදියට අනුව සි/ස බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතිය, සි/ස වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිය සහ ඇවරකරණයට ලක් කර ඇති සි/ස දෙහිවිණිපළාත විවිධ සේවා සමුපකාර සමිතිය යන සමිති 03 ආවරණය වන පරිදී ප්‍රතිචාර ලබාගන්නා ලදී.

ප්‍රශ්නාවලිය සඳහා ප්‍රතිචාර ලබාදුන් නියදියේ වයස් කාණ්ඩයන් 03 කට බෙදා හඳුනා ගන්නා ලදී. එනම්, අවුරුදු 18 -35 , 36-55 හා 55 ට වැඩි වශයෙනි. මූලික විශ්ලේෂණයේදී පහත පරිදි වයස් කාණ්ඩයන්ගෙන් නියදිය සමන්විත විය. 18-35 කාණ්ඩයෙන් 5.4 % ලෙස අඩුම නියදියත්, වැඩිම නියැදිය ලෙස 60.7 % ක් 55 ට වැඩි කාණ්ඩයෙනුත් වශයෙන් මෙම ප්‍රශ්ණාවලිය සමන්විත විය.

වගුව 1: වයස

		Frequency	Percent	Valid Percent	Cumulative Percent
Valid	18-35	3	5.4	5.4	5.4
	36-55	19	33.9	33.9	39.3
	55 UP	34	60.7	60.7	100.0
	Total	56	100.0	100.0	

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

ස්ත්‍රී පුරුෂ අනුව නියදිය සලකා බැලිමේදි 23.2 % ස්ත්‍රීන් ලෙසත් පුරුෂයින් 76.8% ලෙසත් දැක්විය හැකිය.

වගුව 2: ස්ත්‍රී පුරුෂ බව

		Frequency	Percent	Cumulative Percent
Valid	Female	13	23.2	23.2
	Male	43	76.8	100.0
	Total	56	100.0	

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

සමිති අනුව නියදිය සලකා බැලූ විට සි/ස බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතියෙන් ප්‍රතිචාරකයින් 25ක් එනම් 44.6% ක් ද , සි/ස වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතියෙන් 22 ක් එනම් 39.3% ක් සහ ඇවරකරණයට ලක් කර ඇති සි.ස දෙහිවිණිපළාත විවිධ සේවා සමුපකාර සමිතියෙන් 09 ක් හෙවත් 16.1% ක නියෝජනයක් දක්නට ලැබුනි.

වගුව 3: සමිති අනුව නියදිය

		Frequency	Percent	Cumulative Percent
Valid	Bandarawela	25	44.6	44.6
	Welimada	22	39.3	83.9
	Dehivinipalatha	9	16.1	100.0
	Total	56	100.0	

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

මෙම නියැදිය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් ලෙස කටයුතු කල හා කටයුතු කරන අයවළුන් 43% ක් නියෝජනය කරන අතර මහ සභා නියෝජිතයින් 57.1% වේ.

වගුව 4: නියැදියේ සංයුතිය

		Frequency	Percent	Valid Percent	Cumulative Percent
Valid	Director	24	42.9	42.9	42.9
	Maha Saba	32	57.1	57.1	100.0
	Total	56	100.0	100.0	

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

මෙම ප්‍රශ්ණාවලිය සඳහා ප්‍රතිචාර දැක්වූවන්ගේ අධ්‍යාපන මට්ටම් සලකා බැලීමේ දී 5.4% ක් ප්‍රාථමික අධ්‍යාපනය ලැබූවන් වේ. අ.පො.ස සා/පෙළ දක්වා ඉගෙන ගත් පිරිස 16.1% කි. අ.පො.ස සා/පෙළ සමත් පිරිස 39.3% වන අතර අ.පො.ස උ/පෙළ දක්වා උගත් පිරිස 21.4% කි. උසස්පෙළ සමතුන් 17.9% කි.

වගුව 5: අධ්‍යාපන මට්ටම

		Frequency	Percent	Valid Percent	Cumulative Percent
Valid	PRIMARY	3	5.4	5.4	5.4
	To O/L	9	16.1	16.1	21.4
	O/L Pass	22	39.3	39.3	60.7
	To A/L	12	21.4	21.4	82.1
	A/L Pass	10	17.9	17.9	100.0
	Total	56	100.0	100.0	

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

සේවක මණ්ඩලයට යොමුකරන ලද ප්‍රශ්ණාවලිය.

දෙවන කාණ්ඩය ලෙස මෙම පර්යේෂණය සඳහා නියදියට අනුව බණ්ඩාරවෙල සහ වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිවල සේවකයින් වෙත ප්‍රශ්නාවලි 77ක් බෙදා දෙන ලදී. ප්‍රශ්නාවලිය සඳහා ප්‍රතිචාර ලබාදුන් නියදියේ වයස් කාණ්ඩයන් 03 කට බෙදා හඳුනා ගන්නා ලදී. එනම් අවුරුදු 18 -35 , 36-55 හා 55 ට වැඩි වශයෙනි.

මූලික විශ්ලේෂණයේ දී පහත පරිදි වයස් කාණ්ඩයන්ගෙන් නියදිය සමන්විත විය. 18-35 කාණ්ඩයෙන් 16.9 % ලෙසත්, වැඩිම අගය ලෙස 72.7 % ක් 36-55 කාණ්ඩයෙනුත් 10.4 % ක් 55 වැඩි කාණ්ඩයෙනුත් වාර්තා විය.

වගුව 6: වයස් කාණ්ඩයන්

		Frequency	Percent	Cumulative Percent
Valid	18-35	13	16.9	16.9
	36-55	56	72.7	89.6
	55 Up	8	10.4	100.0
	Total	77	100.0	

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

සේවක මණ්ඩල නියදිය ස්ත්‍රී පුරුෂ අනුව සලකා බැලීමේදී 71.4 % ස්ත්‍රීන් ලෙසත් පුරුෂයින් 28.6 % ලෙසත් දැක්විය හැකිය.

වගුව 7: ස්ත්‍රී පුරුෂ බව

		Frequency	Percent	Cumulative Percent
Valid	Female	55	71.4	71.4
	Male	22	28.6	100.0
	Total	77	100.0	

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

සමිති අනුව නියදිය සි/ස බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතියෙන් නියදිය ලෙස 64 ක් එනම් 83.1 % ක් ද , සි/ස වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතියෙන් නියදිය ලෙස 13 ක් එනම් 16.9 % ක් තෝරාගන්නා ලදි.

වගුව 8: සමිති අනුව නියදිය

		Frequency	Percent	Cumulative Percent
Valid	Bandarawela	64	83.1	83.1
	Welimada	13	16.9	100.0
	Total	77	100.0	

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

ප්‍රතිචාරකයින්ගේ අධ්‍යාපන මට්ටම සලකා බැලීමේදී 7.8% ක් අ.පො.ස සා/පෙළ දක්වා ඉගෙන ගත් පිරිස වන අතර 18.2 % ක් අ.පො.ස සා/පෙළ සමත් පිරිස වේ. 29.9 % ක් අ.පො.ස උ/පෙළ දක්වා උගත් පිරිස වූ අතර 42.9 % උසස්පෙළ සමතුන් වේ. උසස් අධ්‍යාපනය ලැබූවන් 1.3 % කි.

වගුව 9: අධ්‍යාපන මට්ටම

		Frequency	Percent	Cumulative Percent
Valid	To O/L	6	7.8	7.8
	O/L Pass	14	18.2	26.0
	To A/L	23	29.9	55.8
	A/L Pass	33	42.9	98.7
	Higher Education	1	1.3	100.0
	Total	77	100.0	

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

විවිධ සේවා සමුපකාර සමිතිවල සාමාජිකයින් වෙත යොමුකරන ලද ප්‍රශ්නාවලිය

තෝරාගත් නියදියට අනුව බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතිය, වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිය සහ ආවරකරණයට ලක් කර ඇති දෙහිවිණිපළාත විවිධ සේවා සමුපකාර සමිතිය යන සමිති 03 ආවරණය වන පරිදී ප්‍රතිචාර ලබාගන්නා ලදී. මෙම නියදියේ වයස අවුරුදු 18-35 කාණ්ඩයෙන් 23.5 % ලෙස ද, 35 % ක් 36- 55 කාණ්ඩයෙනුත් 41.2 % ක් 55 වැඩි වශයෙන් නියෝජනය විය.

වගුව 10: වයස

		Frequency	Percent	Cumulative Percent
Valid	18-35	12	23.5	23.5
	36-35	18	35.3	58.8
	55<	21	41.2	100.0
	Total	51	100.0	

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

මෙම නියදිය ස්ත්‍රී පුරුෂ අනුව සලකා බැලිමේදී 47.1 % ස්ත්‍රීන් ලෙසත් පුරුෂයින් 52.9 % ලෙසත් දැක්විය හැකිය.

වගුව 11: ස්ත්‍රී පුරුෂ බව

		Frequency	Percent	Cumulative Percent
Valid	Female	24	47.1	47.1
	Male	27	52.9	100.0
	Total	51	100.0	

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

සමිති අනුව නියදිය සලකා බලන විට බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතියෙන් 30 ක් එනම් 58.8 % ක් ද, වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතියෙන් 15 ක් එනම් 29.4 % ක් සහ ඇවරකරණයට ලක්කල දෙහිවිනිපළාත විවිධ සේවා සමුපකාර සමිතියෙන් 06 ක් එනම් 11.8 % ක් ලෙස තෝරාගන්නා ලදි.

වගුව 12: සමිති අනුව නියදිය

		Frequency	Percent	Cumulative Percent
Valid	Bandarawela	30	58.8	58.8
	Welimada	15	29.4	88.2
	Dehiinipalatha	6	11.8	100.0
	Total	51	100.0	

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

ද්විතික දත්ත විශ්ලේෂණය සහ ප්‍රතිපල

ව්‍යාපාරික සංවිධානයක සාර්ථකත්වය සඳහා ව්‍යාපාරයේ ජීවන චක්‍රයේ අදියරවල දී අවස්ථානුකූලව නිවැරදි කළමනාකරණ තීරණ ගත යුතුය. ඒ අනුව, සීමාසහිත බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතියේ ජීවන චක්‍රයේ අධ්‍යනය කිරීමේ දී වර්ෂ 50 ක කාලය තුල 1971 සිට 1995 දක්වා වර්ධන අවධිය ලෙස පෙන්නුම් කරයි.

1995 දී සීඝ්‍ර වර්ධනයක් අත්පත් කර ගත්ත ද 1996 සිට 1998 දක්වා කාලය පසුබෑමකට ලක්වී ඇත. 1998 සිට 2003 දක්වා නැවත වර්ධනයක් අත් පත් කර ගෙන ඇති අතර 2004 සිට සීඝ්‍ර වර්ධනයක් දැකිය හැකි විය. බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතියේ ජීවන චක්‍රය තුල 1996, 1998, 2004, 2007, 2013, 2018 යන වර්ෂ සුවිශේෂී තතත්වයක් පෙන්නුම් කරයි. 1996 වර්ෂය වන විට පාරිභෝගික අංශයේ බිඳවැටීමක් පෙන්නුම් කරනු ලදි. එසේම, බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ ප්‍රතිසංවිධානය සහ නවීකරණය මෙන්ම නවීන තාක්ෂණය යොදා ගැනීම හා ග්‍රාමීය බැංකු පද්ධතිය පරිගණක ගත කිරීම වැනි හේතු නිසා 2004 වර්ෂයෙන් පසු සමිතිය සීඝ්‍ර වර්ධනයක් අත්පත් කර ගෙන ඇත. සීමාසහිත වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිය 1970 ලියාපදිංචි කල දිනයේ සිට මේ දක්වා ක්‍රමාණුකූල ලෙස ජීවන චක්‍රයේ වර්ධනයක් ලඟාකරගෙන ඇත.

ලියාපදිංචිය අවලංගු කල සීමාසහිත දෙහිවිනිපළාත විවිධ සේවා සමුපකාර සමිතිය 1970 සිට 2002 දක්වා වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිය හා සමාන වර්ධනයක් පෙන්නුම් කල ද, 2002 දී මෙම සමිතිය ලියාපදිංචිය අවලංගු කිරීම සිදුකර ඇත. ඊට හේතුව ලෙස හෙළිදරව් වූවේ සීමාසහිත දෙහිවිනි පළාත විවිධ සේවා සමුපකාර සමිතිය ආරම්භයේ සිටම මහජන බැංකු අයිරාව මත ම කටයුතු කර තිබීමයි. අධ්‍යනයේ දී සලකා බැලූ සමුපකාර සමිති වල ජීවන චක්‍රය අධ්‍යයනය කිරිමේදී දැකිය හැකි පොදු ලක්ෂණය වන්නේ රජයේ සහනාධාර වැඩ පිළිවෙළ සමඟ බද්ධ ව කටයුතු කල යුගයන් හි බැංකු අයිරාව වත්කම් වලට සාපේක්ෂව ඉතා ඉහළ අගයක් ගෙන ඇති බවයි.

ප්‍රස්ථාරය 1



මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

ප්‍රස්ථාරය 2



මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

ප්‍රස්ථාරය 3



මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

ප්‍රස්ථාරය 4



මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

ප්‍රස්ථාරය 5



මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

ප්‍රස්ථාරය 6



මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

ඉහත ප්‍රස්ථාර මඟින් බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතිය 1973 සිට 1995 දක්වා බැංකු අයිරාව සමිතියේ වත්කම් වලින් 15% වඩා වැඩි ප්‍රමාණයකින් පවත්වාගෙන ගොස් ඇත.

මෙම අයිරාව පාරිභෝගික අංශයේ කටයුතු සඳහා භාවිතා කල අතර, බැංකු අයිරාව මඟින් රජයේ සහනාධාර බෙදා හැරීම සිදු කර ඇත. සමිතියේ බැංකු අයිරාව සමිතියේ වත්කම් අළෙවි කර සහ ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්තයෙන් පියවා ඇතත්, පාරිභෝගික අංශය සඳහා තවමත් අයිරාවක් පවතී. සමුපකාර සමිතියේ පාරිභෝගික අංශයට ග්‍රාමීය බැංකු අංශයේ මුදල් යොදා ගැනීම නතර කිරීමත් සමඟ 2007 පසු ග්‍රාමීය බැංකු අංශයේ වර්ධනයත් සමග සමිතිය සිග්‍ර ලෙස වර්ධනය වෙමින් පවතී. සීමාසහිත වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිය 1981 දක්වා ස්වකීය ප්‍රාග්ධනයෙන් ක්‍රියාත්මක වී ඇති අතර 1971 -1981 වර්ෂය තුල බැංකු අයිරාවක් තිබී ඇත්තේ 1974 වර්ෂයේ පමණි.

1983 දී බැංකු අයිරාව ආරම්භ වන අතර එය 1991- 1999 වර්ෂ වල මුළු වත්කම් වලින් 20% ඉක්මවා පවත්වා ගෙන ගොස් ඇත. සීමාසහිත වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතියේ අයිරාව ඉහලම අගයක් පෙන්නුම් කරන 1993 – 1999 වර්ෂ වල අයිරාව ඉහල යැමට හේතු වී ඇත්තේ සමිතිය විසින් ආනයනික බීජ අර්තාපල් අළෙවි කිරීමට කටයුතු කිරීමයි. මෙම බීජ අර්තාපල් ව්‍යාපෘතිය ශක්‍යතා අධ්‍යයනයකින් තොරව සිදුකර ඇත. බීජ අර්තාපල් ව්‍යාපෘතිය අසාර්ථක ව්‍යාපෘතියක් වු අතර සමිතිය සතු වත්කම් ලෙස පැවති ගොඩනැඟිලි අළෙවිකර අයිරාව පියවීමට කටයුතු කර ඇත. සීමාසහිත දෙහිවිණිපළාත විවිධ සේවා සමුපකාර සමිතිය ආරම්භයේ සිටම වත්කම් වලට සාපේක්ෂව 12% සාමාන්‍ය අගයෙන් යුත් බැංකු අයිරාවක් පවත්වා ගෙන ගොස් ඇත. ග්‍රාමීය බැංකු අංශය වෙනම සමුපකාර සමිතියක් ලෙස ලියාපදිංචි කර මෙම සමිතිය වෙන්කිරීම සහ මහජන බැංකුව මෙම සමිතියට බැංකු අයිරාව ලබා දීම අත්හිටුවීමත් සමඟම මෙම සමිතිය බිඳවැටීමකට ලක් වු අතර මේ හේතුව නිසා ඈවරකිරීම සඳහා ලියාපදිංචිය අවලංගු කරන ලදි.

මහසභා තීරණ හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම

පසුගිය දශක 2 කාලය තුල සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රස්ථාර නිරූපනයක් පහත දැක්වේ.

ප්‍රස්ථාරය 7



මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

ප්‍රස්ථාරය 8



මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

සීමාසහිත බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරිමේ සාමාන්‍ය අගය 68.65% කි. සීමාසහිත වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරිමේ සාමාන්‍ය අගය 79.05% කි. ඈවරකරණයට ලක්කර ඇති සීමාසහිත දෙහිවිණිපළාත විවිධ සේවා සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරිමේ සාමාන්‍ය අගය 49.25% කි.

ප්‍රස්ථාරය 9



මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

සීමාසහිත බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතියේ මහ සභා තීරණ ක්‍රියාත්මක කිරිමේ සාමාන්‍ය අගය 64.61% කි. සීමාසහිත වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතියේ මහ සභා තීරණ ක්‍රියාත්මක කිරිමේ සාමාන්‍ය අගය 81.44% කි. ඈවරකරණයට ලක්කර ඇති සිමාසහිත දෙහිවිණිපළාත විවිධ සේවා සමුපකාර සමිතියේ මහ සභා තීරණ ක්‍රියාත්මක කිරිමේ සාමාන්‍ය අගය 44.07% කි.

1971 -2020 කාලය තුල විගණන දෝෂ වාර්තා කිරීම

1971 සිට 2021 දක්වා විගණන වාර්තා පරිශීලනය කිරිමේ දී තෝරාගත් දෝෂයන් ගැන විගණන වාර්තාවේ විගණකවරු විසින් හෙළිදරව් කිරීම අධ්‍යයනය කිරිමේ දී එම තොරතුරු පහත පරිදි දැකිවිය හැකිය.

වගුව 13: විගණන දෝෂ වාර්තා කිරීම

විගණන දෝෂය	බණ්ඩාරවෙල	වැලිමඩ	දෙහිවිනිපළාත
ගිණුම්කරණ දෝෂ හෙළිදරව් කිරීම	100.00%	100.00%	100.00%
පොත්පත් ලිවිමේ දෝෂ	100.00%	100.00%	100.00%
අවසන් ගිණුම් නිවැරදිතාව පිළිබඳ දෝෂ	100.00%	100.00%	100.00%
මාසික F 28 වාර්තාව විගණනයේ ශේෂ සමඟ නොසැසදීම.	100.00%	100.00%	100.00%
සේවකයන්ට වැඩ පැවරිම පිළිබඳ දෝෂ	96.00%	88.00%	100.00%
ඉකුත් විගණන වාර්තාවේ දෝෂ නැවත අවධාරණය කිරීම.	100.00%	89.00%	100.00%
සැලසුම් සහ අයවැය ඇස්තමේන්තු සත්‍ය ප්‍රතිඵලය සමඟ නොසැසදීම.	98.00%	97.00%	100.00%
අවසන් ගිණුම් විගණකවරු විසින් නැවත සකස් කිරීම	94.00%	86.00%	100.00%

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2023

මේ අනුව පෙනී යන්නේ විවිධ සේවා සමුපකාර සමිති ආරම්භ කල 1970 සිට එනම්, පළමු විගණනය වන 1971 වර්ෂයේ සිට විවිධ සේවා සමුපකාර සමිතිවල ගණනයෙන් අනාවරණය කර ඇති දෝෂයන් නිවැරදි නොවන අතර ගිණුම්කරණ දෝෂයන් සමිතිවල ජීවකාලය පුරාම පැවතී ඇති බවයි.

1971 – 2020 කාලය තුල සමිතියේ ශුද්ධ ලාභ තතත්වය විශ්ලේෂණය

පර්යේෂණයට අදාල සමුපකාර සමිතිවල ශුද්ධ ලාභ තතත්වය අධ්‍යයනය කිරීමේ දී 1971 සිට 1986 දක්වා කාලය තුල සීමාසහිත බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතිය සහ සීමාසහිත වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිය

ශුද්ධ ලාභ සහිතව පවත්වා ගෙන ගොස් ඇති බවත්, ඇවරකරණයට ලක්කර ඇති සීමාසහිත දෙහිවිණිපළාත විවිධ සේවා සමුපකාර සමිතිය අලාභදායකව පවත්වා ගෙනගොස් ඇති බවත් නිරීක්ෂණය විය. 1987 වර්ෂයේ සහ 1971 සිට 1987 දක්වා කාලය තුල ලද මුළු ශුද්ධ ලාභය ඉක්මවා අලාභ ලැබීමට සීමාසහිත බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතියට සිදුව ඇත. සමස්ථයක් වශයෙන් ගත් කල 1987 – 2004 කාලය තුල සමිති ත්‍රිත්වයම අලාභදායක ලෙස පවත්වා ගෙන ගොස් ඇත. මෙම අලාභය පාරිභෝගික අංශය විසින් සිදුකරනු ලබන වෙළඳාමට වඩා රාජ්‍ය සහනාධාර ලබා දීමට කටයුතු කිරීම නිසා ලද අලාභයකි.

2005 වර්ෂයේ සිට රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව රජයේ සහනාධාර බෙදාහැරීම සමුපකාර සමිති වලින් ක්‍රමාණුකූල ලෙස ඉවත් කිරීම නිසා සමුපකාර සමිති වලට විකල්ප ක්‍රම වෙත යොමු විමට සිදුවිය. පාරිභෝගික අංශය භාණ්ඩ බෙදාහැරීම නතර කිරීමත්, ඒ සඳහා බැංකු අයිරාව ලබා ගැනීම නතර කිරීමත් නිසා ග්‍රාමීය බැංකු අංශයේ අතිරික්තය බැංකු අංශය තුලම ආයෝජනයත් නිසා 2005 වර්ෂයෙන් පසු ග්‍රාමීය බැංකු අංශයේ සිදුවූ සිඝ්‍ර වර්ධනයත් සමඟ සමුපකාර සමිති වල ශුද්ධ ලාභය වර්ධනය වී ඇත. 2012 වර්ෂයේ බණ්ඩාරවෙල සමිතිය ඉතිහාසයේ ඉහළම ලාභය වාර්තා කරන අතර වැලිමඩ සමිතිය 2013 වර්ෂයේ ඉතිහාසයේ ඉහළම ලාභය වාර්තා කර ඇත. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් කුමන ආකාරයෙන් හෝ ඉන්ධන ණයට විකිණීම තහනම් කර චක්‍රලේඛයක් නිකුත් කිරීමත් සමඟ ඉන්ධනහල් වලින් ණයට ඉන්ධන නිකුත් කිරීම නතර වීමත්, සියළුම රාජ්‍ය ආයතන වලට තැන්පත් මුදලට පමණක් ඉන්ධන නිකුත් කිරීම නිසාත්, කල් පසු ණය අයකර ගැනීමේ ක්‍රියා පටිපාටිය නිසාත් මෙම ලාභයන් වාර්තා කර ඇත. තවද, 2019 වර්ෂයේ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුගත වෙමින් කල්පසු ණය සඳහා බොල් හා අඩමාන ණය වෙන් කිරීම නිසා සීමාසහිත වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිය ඉතිහාසයේ ලත් ඉහළම අලාභය වාර්තා කර ඇත.

සමුපකාර සමිතිවල තීරණ ගැනීමේ අකාර්යක්ෂමතාවයට හේතු හඳුනා ගැනීම

සමුපකාර සමිතිවල තීරණ ගැනීමේ අකාර්යක්ෂමතාවයට හේතු හඳුනා ගැනීමේ දී හෙළිදරව් වූවේ බහුතරයක් සේවක පිරිස්, අධ්‍යක්ෂ මණ්ඩල හා මහසභා නියෝජිතයින් පසුගිය විගණන වාර්තා පරිශීලනය නොකරන බවයි. නමුත් බහුතරයක් දෙනා ප්‍රකාශකරන ලද්දේ ඉකුත් වර්ෂයේ සමිතියේ ආංශික හා පොදු ලාභ අලාභ තත්වයන් ගැන තමන්ට වැටහීමක් ඇති බවයි. බහුතරයක් දෙනා සමිතියේ අතුරු ව්‍යවස්ථාව පරිශීලනය කිරීම සහ ඒ පිළිබඳ වැටහීම දුර්වල මට්ටමක පවතින බවද හෙළිදරව් විය. අතුරු ව්‍යවස්ථාව තොරතුරු පිළිබඳව වෙනත් අය මඟින් දැනුවත් වන බවද ප්‍රකාශකරන ලදි. බහුතරයක් දෙනා සමිතියේ කාරක නියෝග පරිශීලනය නොකරන බවත් සමිතියේ කාරක නියෝග පිළිබඳව තරමක වැටහීමක් සහ අවබෝධක් පවතින බවත් සේවක කොමිෂන් සභා රෙගුලාසි, ඌව පළාත් සභාවේ සමුපකාර ප්‍රඥප්තිය, සමුපකාර රීති පිළිබඳව දැනීමක් පවතින බවත් අන් අයගෙන් ඒ පිළිබඳ දැනුම ලබාගන්නා බවත් පවසන ලදි.

තීරණ ගැනීමට භාවිතාකරන මූලාශ්‍ර වල නිවැරදිතාවය සලකාබැලීමේ දී, සේවකයින්, අධ්‍යක්ෂ මණ්ඩල හා මහාසභා නියෝජිතයින් බහුතරයක් ප්‍රකාශකරන ලද්දේ සමුපකාර සමිතියක මාසික මෙහෙයුම් වාර්තාව වන ඒෆ් 28 වාර්තාව නිවැරදිව පරිශීලණය නොකරන බවයි. නමුත් එම වාර්තාව පිළිබඳව තමන්ට නිවැරදි වැටහීමක් ඇතිබව බහුතරයක් සඳහන් කරන ලදි. තවද, ඒෆ් 28 වාර්තාව නිවැරදිබව නියැදියෙන් 75% කට වඩා එකඟතාවය පලකරන ලදි. කෙසේනමුත් මෙයින් අදහස් වන්නේ 100% නිවැරදිව සකස් විය යුතු වාර්තාවක නිවැරදිභාවය ගැන ගැටලු ඇති බවයි.

සමිතියේ මාසික මෙහෙයුම් වාර්තාව වන ඒෆ් 28 වාර්තාව ඊලඟ මාසය තුළ සකස් කල යුතු බව නියැදියේ සියළුම දෙනා අවධාරණය කරන ලදි. බහුතරයක් ප්‍රකාශ කරන ලද්දේ මාණ්ඩලික පත්‍ර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට ප්‍රථම මෙහෙයුම් මට්ටමේ කළමනාකාරිත්වය සාකච්ඡා නොකරන බවයි.

පසුගිය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දැන ගනු ලබන්නේ රැස්වීම පවත්වන අතරතුර බව බහුතරයක් ප්‍රකාශකරන ලදි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කල පසු පෙර අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ සඳහන් තීරණය වෙනස් වූ බව දැන ගැනීමට නිසි ක්‍රමවේදයක් නොමැති බව ප්‍රතිචාරකයින් සියළුදෙනා ප්‍රකාශකරන ලදි. සමුපකාර සමිතිවල සැලසුම් සකස්කිරීම පිළිබඳ විග්‍රහ කිරීමේ දී, ඉදිරි වර්ෂ 03 ක් සඳහා සකස්කරන උපායමාර්ගික සැලැස්ම සමඟ බහුතරයක් දෙනා එකඟ නොවේ. සමුපකාර සමිතියේ දැක්ම, මෙහෙවර උපාය මාර්ගික සැලැස්මට අනුකූලව සකස් කිරීම සම්බන්ධයෙන් සේවකයින් 75% ක් එකඟ නොවන අතර අධ්‍යක්ෂ මණ්ඩල හා මහාසභා නියෝජිතයින්ගේ මතය වන්නේ එය එසේ නොවන බවයි. සමුපකාර සමිතියේ ව්‍යාපාර කටයුතු පිළිබඳ ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන පිළිබඳව විග්‍රහයක් සිදුකර ඇති බවට සේවකයින් 76.62 % එකඟ නොවන අතර සමුපකාර සමිතියේ උපාය මාර්ගික සැලැස්ම අනුව ප්‍රගතිය අධ්‍යක්ෂ මණ්ඩලය තුල සාකච්ඡා කරන බවට සේවකයින් 76.62 % එකඟ නොවේ.

එමෙන්ම, සමුපකාර සමිතියේ උපායමාර්ගික සැලැස්ම අවස්ථානුකූලව සංශෝධනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සාකච්ඡා කරන බවට 80.52 % එකඟ නොවන අතර සමිතියේ උපාය මාර්ගික සැලැස්මට අනුව සකස් කර ඇති වාර්ෂික සැලැස්මක් පවතී ද යන්නට 64.94% ක් එකඟ විය. සමිතියේ දැක්ම මෙහෙවර අනුව වාර්ෂික සැලැස්ම සකස් කර ඇද්ද යන්න පිළිබඳව බහුතරයක් දෙනා එකඟ වේ. සමිතියේ වාර්ෂික සැලැස්ම අනුව ප්‍රගතිය අධ්‍යක්ෂ මණ්ඩලය තුල සාකච්ඡා කරන බවට බහුතරයක් මධ්‍යස්ථ වන අතර සමිතියේ වාර්ෂික සැලැස්ම අවස්ථානුකූලව සංශෝධනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තුල සාකච්ඡා කරන බවට නියැදියේ බොහෝමයක් දෙනා එකඟ නොවීය. අනෙක් අතට, සමිතියේ වාර්ෂික සැලැස්මට අනුව ප්‍රගතිය මාසිකව සමාලෝචනය කරන බවට බහුතරයක් එකඟ වන අතර සමිතියේ වාර්ෂික සැලැස්ම අනුව ප්‍රගතිය මාසිකව

සමාලෝචනය කරන බවට සහ ඉටුකර ගත නොහැකි ඉලක්ක සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග සතුටුදායක බවට බහුතරයක් එකඟ නොවේ. සමිතියේ වාර්ෂික සැලැස්මේ ඉලක්ක හා සත්‍ය කාර්යසාධන තත්ත්වය පිළිබඳ බහුතරයක් දෙනා එකඟ නොවේ. සැලැස්මේ ඉලක්ක හා සත්‍ය කාර්යසාධන අතර විශාල වෙනස්කම් පවතින බව ප්‍රකාශකරන ලදි. සමුපකාර සමිතියක සැලසුම් සකස් කිරීම හුදෙක් නීතිමය අවශ්‍යතාවක් පමණක් වන අතර, එය සමිතියේ සැබෑ කාර්යසාධනය උදෙසා නොවේ යන ප්‍රකාශයට නියැදියෙන් 57% ක් දැඩිව එකඟ විය. එලෙසම, සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ සේවකයින් වෙත සන්නිවේදනය වන්නේ එම තීරණය එම සේවකයාට අදාළ නම් පමණක් බහුතරයක් ප්‍රකාශකරන ලදි.

5. නිගමන හා නිර්දේශ

නිගමන

විවිධ සේවා සමුපකාර සමිතිවල අකාර්යක්ෂමතාවය සඳහා තීරණ ගැනීමේ බලපෑම හෙළිදරව්කර ගැනීම සඳහා සිදුකල මෙම පර්යේෂණය මඟින් සමුපකාර සමිතිවල තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සෘජුව බලපෑමකට ලක්වන අතර මෙකී රාජ්‍ය ප්‍රතිපත්ති මත ගනු ලබන තීරණ වෙනස් කිරීමට සමුපකාර සමිතියට හැකියාවක් නැති බවත් එම තීරණ නිසා සමිතියට හානියක් සිදුවුවහොත් සමිතිය විසින් එය දරාගත යුතු බවත් අනාවරණය කරගන්නා ලදි. තවද, රජයේ සහනාධාර බෙදාහැරීම සමුපකාර සමිතිවල අඛණ්ඩ පැවැත්මට හිතකර තත්වයක් නොවේ.

රාජ්‍ය සහනාධාර බෙදාහැරීම සඳහා සමිති දිගින් දිගටම බැංකු අයිරා මත කටයුතු කිරීම, පෙර විගණන වාර්තා පරිශීලණය නොකිරීම, වාර්ෂිකව විගණනය සිදු කල ද ඒ තුලින් අනාවරණය වන විගණන ඌණතා නිවැරදි කිරීමට සමිති කටයුතු නොකිරීම, තීරණ ගැනීමේ දී පරිශීලනය කල යුතු වාර්තා හා ලේඛණ පිළිබඳ දැනුම අඩුවීම, සමිතියේ සැබෑ කාර්යසාධනය පෙන්වන මාසික

මෙහෙයුම් වාර්තාවේ නිවැරදිතාවය පිළිබඳව බහුතරයක් දෙනාගේ විශ්වාසය අල්ප වන අතර තීරණ ගැනීමේ දී වඩාත් නිවැරදි තීරණය ගැනීමට මෙම වාර්තාව උපයෝගී කර ගැනිම ගැටලු තත්ත්වයකි. සමුපකාර සමිති සේවකයින් හා අධ්‍යක්ෂ මණ්ඩල අතර තොරතුරු පිළිබඳ සන්නිවේදනය දුර්වල තතත්වයක පවතින බවද අධ්‍යනයෙන් හෙළිදරව් විය. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම සිදුකල පසු එය නිවැරදිව සන්නිවේදනය නොවීම නිසා අවලංගු කල හෝ සංශෝධනය වු තීරණ දිගින් දිගටම ක්‍රියාත්මක වීමට ද හැකියාවක් පවතී. සමිතියේ සකස්කරනු ලබන උපාය මාර්ගික සැලසුම් සමිතියේ දිගුකාලීන උපායමාර්ගික අවශ්‍යතා සඳහා නොවන අතර සමිතියේ දැක්ම හා මෙහෙවර ලඟාකරගැනීමට උචිත ද යන්න ගැටළුවක් පවතී. ව්‍යාපාරයේ ශක්තීන්, දූර්වලතා, අවස්ථා හා තර්ජන ගැන විග්‍රහයක් සිදු කිරීම සතුටුදායක මට්ටමක නොමැත. වාර්ෂික සැලැස්මේ ප්‍රගතිය මාසිකව සමාලෝචනය කිරීමේ දී හා ඉටුකර ගත නොහැකි ඉලක්ක සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග සතුටුදායක මට්ටමක නොපවතින අතර වාර්ෂික සැලැස්මේ ඉලක්ක හා සත්‍ය තතත්වය පිළිබඳව ගැටළු පවතී. සමුපකාර සමිතියක සැලසුම් සකස් කිරීම හුදෙක් නීතිමය තත්වයක් සඳහා පමණක් වන අතර බහුතරයක් ඊට එකඟ වීම තුළ මේ පිළිබඳව නැවත සිතියයුතු තතත්වයක් පැන නඟී. මේ අනුව, විවිධ සේවා සමුපකාර සමිති අකාර්යක්ෂමතාවයට තීරණ ගැනීමේ ක්‍රියාවලියේ යම් බලපෑමක් සිදුකරන බව පර්යේෂණයෙන් හෙළිදරව් විය.

නිර්දේශ

1. රාජ්‍ය සහනාධාර බෙදාහැරීම සමිතියේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලට බාධා නොවන පරිදි සිදුකිරීමට සමිති කටයුතු කල යුතු බවත් තරඟකාරී වෙළඳපොල වෙත සමුපකාර සමිති පිවිසීමේ දී සමුපකාර සන්නාමය හා රාජ්‍ය බැඳියාව පාරිභෝගිකයින් හට අවධාරණය කිරීමට කටයුතු කල යුතුය.
2. සමුපකාර සමිති විසින් තීරණ ගැනීමේ දී පරිශීලනය කල යුතු ලේඛණ හා වාර්තා පරිශීලනය ඉහළ නැංවීමට කටයුතු කල යුතු අතර සමුපකාර අධ්‍යාපනය සඳහා ප්‍රමුඛ අවධානයක් සමිති විසින් ලබා දිය යුතුය. එසේම, සමුපකාර අධ්‍යාපනය සඳහා පිහිටුවා ඇති ආයතන විසින් සමුපකාර සමිති

වල අධ්‍යක්ෂ මණ්ඩලය හා මහා සභා නියෝජිතයින් සම්බන්ධ පුහුණු වැඩසටහන් තවදුරටත් ඉහළ නැංවිය යුතුය.

3. විගණනයන් තුළින් අනාවරණය වන විගණන ඌණතා නිවැරදි කිරීමට සමුපකාර සමිති සහ සමුපකාර දෙපාර්තමේන්තුව විසින් යාන්ත්‍රණයක් සැකසිය යුතුය.
4. සමිතියේ සකස් කරණු ලබන උපායමාර්ගික සැලසුම් සමිතියේ දිගුකාලීන අවශ්‍යතා සඳහා සැකසීම සිදුකළ යුතු අතර සමිතියේ දැක්ම, මෙහෙවර ඒ තුළින් ආවරණය විය යුතුය.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (References)

අබේපාල, ර. (2011). *නියැදීකරණය.* කොළඹ: සාර ප්‍රකාශණ.

අබේසිංහ, ඒ. (2011). *සමුපකාරය ප්‍රජා සංවර්ධනය හා කාන්තා සහභාගීත්වය.* කොළඹ: ආරිය ප්‍රකාශකයෝ.

කලුආරච්චි, ක. (2004). *කළමනාකරොණය අනුකලිත ප්‍රවේශය.* කොළඹ: කතෘ ප්‍රකාශන.

කලුආරච්චි, ක. (2012). *ජාත්‍යන්තර ව්‍යාපාර කළමනාකරණය.* මරදාන: ගොඩගේ ප්‍රකාශකයෝ.

කලුආරච්චි, ක. (2018). *ව්‍යවසායකත්වය (හැදින්වීම සහ සිද්ධි අධ්‍යයනය).* කොළඹ. එස් ගොඩගේ ප්‍රකාශකයෝ.

ගලගමගේ, ප්‍ර. (2020). *සමුපකාර සංවර්ධන දක්ෂිණ ශාස්ත්‍රීය සංග්‍රහය.* ගාල්ල: සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, දකුණු පළාත.

ඩැනිසන්, ව. (2012). *සමුපකාරය හා විද්වත් මත.* කරගම්පිටිය: සීමාසහිත කරගම්පිටිය කවුඩාන ස.ණ.ස සමිතිය.

තකාමුරා, ඉ. (2001). *සමුපකාර කළමනාකරණයේ මූලධර්ම.* මහනුවර: සමුපකාර පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය.

නිශාන්ත, බ. (2019). *ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය.* මරදාන: එස් ගොඩගේ ප්‍රකාශකයෝ.

බණ්ඩාර, බ. (2011). *ලෝක වෙළදාම හා සමුපකාර ව්‍යාපාරය.* සේතුක ප්‍රකාශණ.

බුලත්ගම, ඒ. (2011). *ශ්‍රී ලංකාවේ සමුපකාර නීති ඉතිහාසය.* කොළඹ: සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.

මාතරආරච්චි, ම. (1997). *සමුපකාර පෙරදැක්ම.* කර්තෘ ප්‍රකාශණය.

රාජකීය කොමිෂන් සභා වාර්තාව. (1970). *ලංකාවේ සමුපකාර ව්‍යාපාරය පිළිබඳ රාජකීය කොමිෂන් සභා වාර්තාව - ii වන සැසි වාර්තාව.* කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

ලලිතධීර, ක. (2019). *පර්යේෂණ ක්‍රමවේදය සහ ක්‍රම.* කිරිවත්තුඩාව: එල්.ඩී ප්‍රකාශකයෝ.

ලාලනි කේ, ග. (2011). *ක්‍රියාමූලික පර්යේෂණ න්‍යාය හා ව්‍යවහාරය.* කොළඹ: කර්තෘ ප්‍රකාශණ.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, ඌ. ප. (2023). *විගණන වාර්තා (සීමාසහිත බණ්ඩාරවෙල විවිධ සේවා සමුපකාර සමිතිය, සීමාසහිත වැලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිය, සීමාසහිත දෙහිවිනිපළාත විවිධ සේවා සමුපකාර සමිතිය- 1971-2021).* බදුල්ල: සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, ඌව පළාත. (2023). *සංඛ්‍යා ලේඛණ වාර්තාව - 2019-2021.* බදුල්ල: සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.

සේනාධීර, සි., & වනසිංහ, ශා. (2021). *පර්යේෂණ ක්‍රමවේදය.* මරදාන: එස් ගොඩගේ ප්‍රකාශකයෝ.

හේරත්, උ. (2000). *සමුපකාර අනන්‍යතාවය පිළිබඳ ප්‍රකාශය.* මහනුවර: සමුපකාර පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය.

හේරත්, උ. (2011). *සමුපකාර අනන්‍යතාවය හා තවත් ලිපි.* කොළඹ: සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.